ඊසා (අලෛ) (ජේසුස් වහන්සේ) තුමානන් හා මර්යම් (අලෛ)
(මරිය) තුමිය පිළිබඳව අල්කුර්ආනයේ සඳහන් සත්‍ය තොරතුරු

(කිතණුවන් අනිවාර්යයෙන් ම දැනගත යුතු කාරණාවන්)

ප්‍රකාශන

MASFOT
Raise Yourself To Help Mankind
NABA
MAS FOUNDATION TRUST

Sinhala JeM

MAS Foundation Trust, 19, Thacker Street, Purasawalkam, Chennai 600084.
88388 92393


God had created the Universe and estableshed Adam (the first man) on the earth to live based on the following Three main Priciple only.
Until the doomsday these three priciples must be adhered by all.
You and your descendants must know and follow it in order to attain Paradise after death. Here are they:



Monotheism



Prophethood



Life after Death

ඊසා (අලෙ) (ජේසුස් වහන්සේ) තුමානන් හා මර්යම් (අලෙ) (මරිය) තුමිය පිළිබඳව අල්කුර්ආනයේ සඳහන් සත්‍ය තොරතුරු

(කිතණුවන් අනිවාර්යයෙන් ම දැනගත යුතු කාරණාවන්)

ප්‍රකාශන



MAS Foundation Trust
19 Thacker Street
Purasawalkam
Chennai 600084
INDIA
+91 88388 92393

ප්‍රකාශිත සටහන

ආදරණීය සහෝදර සහෝදරියනි ඔබගේ දෑත් මත දැවටෙන මෙම කෘතිය (කිතනුවෙක් වශයෙන්) ඔබ විශ්වාස කරන ජේසුස් වහන්සේ (ඊසා (අලෙ)) සහ ඔහුගේ මව වන මරියතුමිය (මර්යම් (අලෙ)) පිළිබඳව මුස්ලිම් වරුන්ගේ අවසාන දේවදූතයා වන මුහම්මද් (සල්) තුමානන් හට පහළ කරන ලද අවසාන දේව ග්‍රන්ථයේ සඳහන් වන සත්‍ය තොරතුරු අන්තර්ගත වූ කෘතියකි.

බොහෝ කිතණු ජාතීන් මුස්ලිම්වරුන් හා තමන් අතර යම් හෝ සම්බන්ධතාවයක් ඇති බව විශ්වාස කලත් එය කුමක්ද යන්න පිළිබඳ වූ පැහැදිලි දැක්මක් එම උදවියන්ට නොමැත. එමනිසා ඔවුන්ට එම සම්බන්ධතාවය පිළිබඳ ඉතා කෙටි අදහසක් පැහැදිලි කරන ආකාරයෙන් මෙම කෘතිය සැකසී ඇත.

දේව වක්තෘවරයා වන ඉබ්‍රාහීම් (අලෙ) තුමාණන්ට ඉස්මායීල් (අලෙ) සහ ඉස්හාක් (අලෙ) නමැති පිරිමි දරුවන් දෙදෙනෙක් සිටීහ. ඉස්හාක් (අලෙ) තුමාණන්ගේ පරම්පරාවේ බොහෝ නබිවරුන් පැමිණි අතර මූසා (අලෙ) සහ ඊසා (අලෙ) වැනි දේවදූතයන් එයට උදාහරණ වේ. මෙම සියලු අය දේව වක්තෘවරුන් බවට අල්කුර්ආනය සනාත කරයි.

ඉස්මායීල් (අලෙ) තුමානන්ගේ පරම්පරාවේ පැමිණි අවසාන දේවදූතයා වන්නේ මුහම්මද් (සල්) තුමානන්ය. අවසාන දේවදූතයා ඉස්මායිල්ගේ පරම්පරාවේ පැමිණෙනු ඇතැයි පැරණි සංශෝධනයේ හා නව සංශෝධනයේ ඉතා පැහැදිලිව සඳහන් වී ඇත.

එය සනාථ කරන අයුරින් වසර 1400ට පෙර වත්මන් සවුදි අරාබියාවේ ඉස්මාඊල් (අලෙ) තුමාණන්ගේ පරම්පරාවේ මුහම්මද් (සල්) තුමානන් ඉපත ලැබුවේය. මුහම්මද් (සල්) තුමානන් ඔහුගේ හතළිස් වන වියේදී දූතභාවය ලබාගත් අතර

එතුමාණන්ගේ හැට තුන්වන වියේදී මරණයට පත් විය. මෙම අවුරුදු විසිතුනක කාලය තුළ අල්ලාහුතාලා ජිබ්රීල් (අලෙ) නමැති සුරදූතයා මාර්ගයෙන් නබිතුමාට ශුද්ධ වූ කුර්ආනය පහළ කළේය. මෙය අවසාන වූ දේව ග්‍රන්ථය වන අතර මුහම්මද් තුමානන්ට පසුව මෙලොව විනාශය වන තුරු කිසිදු දේවදූතයෙක් නොපැමිණෙනු ඇත.

මෙම අවසාන දේව ග්‍රන්ථය, අවසාන දූතයාට පෙර මෙලොවට පැමිණි ආදම් (අලෙ) සිට ඊසා (අලෙ) දක්වා ඇති සියලු දේවදූතයන්ගේ පැමිණීම තහවුරු කරයි. මෙලෙස පැමිණි සියලු දූතයන් මෙලොවේ ප්‍රචාරය කළ චින්තනයන් දෙකකි. පළමුවන චින්තනය මෙලොව මවා පරිපාලනය කරන එකම දෙවියා වන අල්ලාහ්ට පමණක් නැමදුම් කර යටත් විය යුතුය යන්නයි. දෙවන චින්තනය මිනිසා ජීවත්වීමට අවශ්‍ය කරන නීති රීති දෙවියන් වක්තෘවරයෙක් ලෙස තෝරන්නා වූ දේවදූතයන් හට ලබා දෙනු ඇත යන්නයි. මෙම අණ පිළිපැද සියලු මිනිසුන් ජීවත්විය යුතුයි යන්න දේව නියමයයි. ඒ අනුව අල්කුර්ආනය අවසාන දේවදූතයාට පෙර මෙලොවට පැමිණි දේවදූතයන් සහ ඔවුන්ට ලබා දෙන ලද ග්‍රන්ථ තහවුරු කරයි. මෙලෙස අවසාන දේවදූතයා පැමිණීමට වසර හයසීයට පෙර මෙලොවේ ඉපදුනු ඊසා (අලෙ) (ජේසුස් වහන්සේ) තුමානන් පිළිබඳව හා ඔහුගේ මව මර්යම් (අලෙ) (මරිය) තුමිය මෙලෝ මත ගෞරවාන්විතව ජීවත්වූ ආකාරය ද ඊසා (අලෙ) තුමාණන්ගේ උපත සිදු වූ ආකාරය ද දෙවියන් ශුද්ධ වූ අල්කුර්ආනයේ ඉතා පැහැදිලිව පවසනු ඇත. අල්කුර්ආනයේ අදහසට අනුව එතුමාණන් දේව වක්තෘවරයෙකු වන බවත් කිසිදු විටෙක ඔහු දෙවියෙක් සහ දෙවියාගේ පුතෙකු නොවන බවටත් එසේ පැවසීම මහා පාපයක් බවට පැහැදිලි වේ. කිතණු සමාජයට අල්කුර්ආනයේ සඳහන් සත්‍යතාවය පැහැදිලි කර ගැනීමට එහි සඳහන් වැකි තනි තනිවම ගොනුකර මෙම කෘතිය සකස් කර එළි දක්වන ලදී. මෙය කියවා එය වටහාගැනීමට අපගේ ගෞරවනීය ඇරයුමයි මේ.

ඊසා (අලෙ) (ජේසුස්) තුමා සහ මර්යම් (අලෙ) (මරිය) තුමිය පිළිබඳව කුර්ආනය

අල් බකරා 2:87

තවද නියත වශයෙන්ම අපි මූසාට ග්‍රන්ථය පිරිනැමුවෙමු. තවද ඔහුගෙන් පසුව ධර්ම දූතයින්ව අනුපිළිවෙළින් යැව්වෙමු. තවද මර්යම්ගේ පුත් ඊසාට පැහැදිලි සාධකයන් පිරිනැමුවෙමු. තවද පිවිතුරු ආත්මය තුළින් ඔහුව අපි බලවත් කළෙමු. නුඹලා ප්‍රිය නොකරන යමක් ධර්ම දූතයෙකු නුඹලා වෙත ගෙන ආ සෑම විටකම නුඹලා උඩඟුකම් පෑවෙහුය. එවිට නුඹලා පිරිසක් බොරු කළ අතර තවත් පිරිසක්ව ඝාතනය කළාහුය.

අල් බකරා 2:136

අපි අල්ලාහ්ව විශ්වාස කළෙමු. තවද අප වෙත පහළ කළ දෑ ද ඉබ්‍රාහීම්, ඉස්මාඊල්, ඉස්හාක්, යඃකුබ් හා අස්බාත් (ඔවුන්ගේ පරපුර) වෙත පහළ කළ දෑ ද මූසා හා ඊසා වෙත පිරිනමනු ලැබූ දෑ ද තම පරමාධිපතිගෙන් නබිවරුන්ට පිරිනමනු ලැබූ දෑ ද විශ්වාස කළෙමු. ඔවුන් අතුරින් කිසිවෙකුව අපි වෙන් නොකළෙමු තවද අපි ඔහුට අවනත වූවෝ වූයෙමු.

අල් බකරා 2:253

මෙම රසූල්වරුන්, ඔවුන්ගෙන් ඇතැමෙකු ඇතැමෙකුට වඩා අපි උසස් කළෙමු. ඔවුන් අතුරින් අල්ලාහ් සමඟ කතා කළ අය වෙති. ඔවුන්ගෙන් ඇතැමෙකුට තරාතිරම් උසස් කළෙමු. මර්යම්ගේ පුත් ඊසාට පැහැදිලි සාධකය පිරිනැමුවෙමු. පිවිතුරු ආත්මය තුළින් ඔහු ව අපි ශක්තිමත් කළෙමු. අල්ලාහ් අභිමත වූයේ නම් ඔවුනට පසු පැමිණි සමහරුන් ඔවුනට පැහැදිලි සාධක පැමිණි පසුව මිස

ඔවුන් මරා නොගන්නට තිබිණ. නමුත් ඔවුහු මතභේද ඇති කර ගත්තෝය. එනමුත් ඔවුන් අතුරින් විශ්වාස කළ අය ද ඔවුන් අතුරින් ප්‍රතික්ෂේප කළ අය ද වෙති. අල්ලාහ් අභිමත වූයේ නම් ඔවුන් මරා නොගන්නට තිබුණි. එනමුත් අල්ලාහ් තමන් සිතන දේ සිදු කරන්නේය.

ආල ඉම්රාන් 3:33

සැබැවින් ම අල්ලාහ් ආදම් ව ද නූහ් ව ද ඉබ්‍රාහීම්ගේ පවුල ද ඉම්රාන්ගේ පවුල ද ලෝවැසියනට වඩා තෝරා ගත්තේය

ආල ඉම්රාන් 3:34

ඔවුන්ගෙන් ඇතැමෙක් ඇතැමෙකුගෙන් වූ පරපුරකි. තව ද අල්ලාහ් සර්ව ශ්‍රාවක ය. සර්ව ඥානීය

ආල ඉම්රාන් 3:35

මාගේ පරමාධිපතියාණනි, සැබැවින් ම මම මාගේ කුස තුළ ඇති දෑ කැප කරනු ලැබූවක් ලෙස ඔබ වෙනුවෙන් භාරයක් තැබුවෙමි. නියත වශයෙන්ම ඔබ සර්ව ශ්‍රාවක ය සර්ව ඥානී ය යැයි ඉම්රාන්ගේ බිරිය පැවසූ අවස්ථාව සිහිපත් කරනු.

ආල ඉම්රාන් 3:36

පසු ව ඇය එය ප්‍රසූත කළ කල්හි, මාගේ පරමාධිපතියාණනි, සැබැවින් ම මම එය ගැහැණු දරුවෙකු ප්‍රසූත කළෙමි. - තව ද ඇය ප්‍රසූත කළ දෑ පිළිබඳ ව අල්ලාහ් මැනවින් දන්නා ය. පිරිමියා ගැහැණිය මෙන් නොව.- තව ද සැබැවින් ම ඇයට මම මර්යම් යැයි නම් තැබුවෙමි. තව ද ඇයට හා ඇයගේ පරපුරට පලවා හරින ලද ෂෙයිතාන්ගෙන් සිට ඔබෙන් ආරක්ෂාව පතන්නෙමි යැයි ඇය පැවසුවාය.

ආල ඉම්රාන් 3:37

එවිට ඇයගේ පරමාධිපති යහපත් පිළිගැනීමකින් ඇය ව පිළිගත්තේය. තව ද යහපත් වැඩීමකින් හදාවඩා ගන්නට සැලැස්සුවේය. ඇය ව සකරිය්යාට භාර කළේය. නැමදුම් ස්ථානයේ ඇය වෙත සකරිය්යා පිවිසෙන සෑම අවස්ථාවක ම ඇය අසල ආහාර දුටුවේය. අහෝ මර්යම් ඔබට මෙය කෙසේ (ලැබුණේ) ද යැයි ඇසුවේය. මෙය අල්ලාහ් වෙතින් යැයි ඇය පැවසුවාය.නියත වශයෙන් ම අල්ලාහ් තමන් අභිමත අයට ගණනයකින් තොර ව පෝෂණය ලබා දෙන්නේය.

ආල ඉම්රාන් 3:42

අහෝ මර්යම් නියත වශයෙන් ම අල්ලාහ් ඔබ ව තෝරා ගත්තේය. ඔබව පිවිතුරු කළේය. තව ද ලෝවැසි කාන්තාවන්ට වඩා ඔබ ව තෝරා ගත්තේය යැයි මලක්වරුන් පැවසූ අවස්ථාව සිහිපත් කරනු.

ආල ඉම්රාන් 3:43

අහෝ මර්යම්, ඔබ ඔබේ පරමාධිපතියට අවනත වනු. (නළල බිම තබා) සුජූද් කරනු. තව ද රුකුළ කරන්නන් සමඟ ඔබ ද රුකුළ කරනු.

ආල ඉම්රාන් 3:44

මෙය ගුප්ප පුවත් අතුරිනි. අපි එය නුඹට හෙළිදරව් කරන්නෙමු. මර්යම්ට භාරකාරත්වය දරනුයේ ඔවුන්ගෙන් කවුරුන්දැයි යන්න පිළිබඳ ව ඔවුන් කුසපත් දමන විට ඔවුන් අසල නුඹ නොසිටියෙහිය. එමෙන්ම ඔවුන් වාද කරන විට ඔබ ඔවුන් අසල නොසිටියෙහිය.

ආල ඉම්රාන් 3:45

අහෝ මර්යම් ! නියත වශයෙන් ම අල්ලාහ් ඔහුගෙන් වූ වදනක් පිළිබඳ ඔබට ශුභාරංචි දන්වන්නේය. ඔහුගේ නම මර්යම්ගේ පුත්

ඊසා හෙවත් මසීහ් ය. ඔහු මෙලොව හා මතුලොව නිලයක් ඇති දේව සමීපතයින් අතුරින් කෙනෙකි.

ආල ඉම්රාන් 3:46

තව ද ඔහු තොටිල්ලෙහි පසුවන වියේ දී ද තුරුණු වියේ දී ද ජනයා සමඟ කතා කරනු ඇත. තව ද ඔහු දැහැමියන් අතුරින් කෙනෙකි.

ආල ඉම්රාන් 3:47

මාගේ පරමාධිපතියාණනි, කිසිදු මිනිසෙකු මා ස්පර්ශ නොකර තිබිය දී මට කෙසේ නම් දරුවෙක් ලබන්නේ දැයි ඇය පැවසුවාය. එලෙසය, අල්ලාහ් තමන් අභිමත දෑ මවන්නේය. ඔහු යම් කරුණක් තීන්දු කළ විට එයට වනු යැයි පවසනවා පමණ ය එය සිදු වන්නේය.

ආල ඉම්රාන් 3:48

තව ද ඔහු ඔහුට දේව ග්‍රන්ථය ද ප්‍රඥාව ද තව්රාතය ද ඉන්ජීලය ද උගන්වන්නේය.

ආල ඉම්රාන් 3:49

ඉස්රාඊල් දරුවන්ට ධර්ම දූතයෙකු ලෙසින්, නියත වශයෙන් ම මම නුඹලාට නුඹලාගේ පරමාධිපතිගෙන් සංඥාවක් ගෙන ආවෙමි. සැබැවින් ම මම නුඹලාට පක්ෂියෙකු හැඩය මෙන් (ජීවියෙකු) මැටියෙන් මවමි. පසුව මම එහි පිඹිමි එවිට එය අල්ලාහ්ගේ අනුමැතියෙන් පක්ෂියෙකු වනු ඇත. තව ද මම සුදු කබර හා කළු කබර සුව කරමි. අල්ලාහ්ගේ අනුමැතියෙන් මියගියවුනට ජීවය දෙමි. නුඹලා අනුභව කරන දෑ ගැන ද

නුඹලාගේ නිවෙස් තුළ නුඹලා රැස් කරන දෑ ගැන ද මම නුඹලාට දන්වා සිටිමි. නුඹලා විශ්වාසවන්තයින් නම් සැබැවින් ම නුඹලාට මෙහි සාධකයක් ඇත.

ආල ඉම්රාන් 3:50

තව ද මා ඉදිරියේ ඇති තව්රාතය තහවුරු කරන්නෙකු වශයෙන් ද නුඹලා වෙත තහනම් කරනු ලැබූ ඇතැම් දෑ නුඹලාට මා අනුමත කරනු පිණිස ද, තව ද නුඹලාගේ පරමාධිපතිගෙන් වූ සංඥාවක් මම නුඹලා වෙත ගෙන ආවෙමි. එබැවින් නුඹලා අල්ලාහ්ට බැතිමත් වනු. තව ද නුඹලා මට අවනත වනු.

ආල ඉම්රාන් 3:51

සැබැවින් ම අල්ලාහ් මාගේ පරමාධිපති වේ. එමෙන් ම නුඹලාගේ ද පරමාධිපති වේ. එබැවින් නුඹලා ඔහුට නැමදුම් ඉටු කරනු. ඍජු මාර්ගය මෙය යි.

ආල ඉම්රාන් 3:52

ඔවුන් අතර ප්‍රතික්ෂේප කිරීම ඊසා වටහා ගත් කල්හි, අල්ලාහ් වෙත මට උදව් කරන්නන් කවුරුන් දැයි විමසා සිටියේය. හවාරීය්යීන්වරු (ගෝලයන්) අල්ලාහ්ගේ උදව් කරුවෝ අපි වෙමු. අපි අල්ලාහ් ව විශ්වාස කළෙමු. තව ද නියත වශයෙන් ම අපි මුස්ලිම්වරු යන්නට ඔබ සාක්ෂි දරනු යැයි පවසා සිටියෝය.

ආල ඉම්රාන් 3:53

අපගේ පරමාධිපතියාණනි, ඔබ පහළ කළ දෑ අපි විශ්වාස කළෙමු. රසූල්වරයා ව ද අපි අනුගමනය කළෙමු. එබැවින් ඔබ අප ව සාක්ෂිකරුවන් සමඟ සටහන් කර ගනු මැනව !

ආල ඉම්රාන් 3:54

තව ද ඔවුහු කුමන්ත්‍රණ කළෝය. අල්ලාහ් ද කුමන්ත්‍රණ කළේය. තව ද අල්ලාහ් කුමන්ත්‍රණ කරන්නන්ගෙන් අති ශ්‍රේෂ්ඨයා ය.

ආල ඉම්රාන් 3:55

අහෝ ඊසා ! සැබැවින් ම මම නුඹ ව පූර්ණත්වයට පත් කරමි. නුඹ ව මා වෙතට ඔසවා ගනිමි. ප්‍රතික්ෂේප කළවුන්ගෙන් මම නුඹ ව පිවිතුරු කරමි. මළවුන් කෙරෙන් නැගිටුනුවනු ලබන දින නුඹ ව ප්‍රතික්ෂේප කළවුනට වඩා නුඹ ව පිළිපැද්දවුන් ව ඉහළින් තබමි. පසු ව මා වෙත ය, නුඹලාගේ නැවත යොමු වන ස්ථානය ඇත්තේ. එවිට මම නුඹලා අතර නුඹලා කවර දෙයක මතභේද ඇති කර ගනිමින් සිටියේ ද එවැනි දෑ පිළිබඳ ව තීන්දු දෙමි යැයි අල්ලාහ් පැවසූ අවස්ථාව සිහිපත් කරනු.

අන් නිසා 4:157

අල්ලාහ්ගේ දූතයකු වන මර්යම්ගේ පුත් ඊසා මසීහ් ව සැබැවින්ම අපි ඝාතනය කළෙමු යැයි ඔවුන් පැවසූ හෙයින් ද; නමුත් ඔවුහු ඔහු ව ඝාතනය නොකළහ. එමෙන්ම ඔවුහු ඔහු ව කුරුසයේ බැඳ නොතැබූහ. නමුත් ඔවුනට ඔහු ව ආදේශ කරන ලදී. තවද සැබැවින්ම ඔහු සම්බන්ධයෙන් මතභේද ඇති කර ගත්තවුන් ඔහු පිළිබඳ ව සැකයෙහි පසුවෙති. ඔවුන් අනුමාන පිළිපැදීම හැර ඔහු ගැන වෙනත් කිසිදු දැනුමක් ඔවුනට නොමැත. තවද ඔවුහු ඔහු ව තිරසාර ව ඝාතනය නොකළෝය.

අන් නිසා 4:159

දේව ග්‍රන්ථය ලැබූ කිසිවෙකු ඔහු (මෙලොවට පැමිණ) මරණයට පත් වීමට මත්තෙන් ඔහු ව විශ්වාස කරනවා මිස නැත. තවද මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දින ඔහු ඔවුනට එරෙහි ව සාක්ෂිකරුවකු වනු ඇත.

අන් නිසා 4:171

දේව ග්‍රන්ථ ලැබූවනි! නුඹලාගේ දහමෙහි නුඹලා සීමාව ඉක්මවා නොයනු. අල්ලාහ් කෙරෙහි සත්‍යය මිස (වෙන කිසිවක්) නොපවසනු. මර්යම්ගේ පුත් ඊසා හෙවත් මසීහ් අල්ලාහ්ගේ දූතයෙකි. එය ඔහුගේ වදනකි. එය මර්යම් වෙත හෙළුවේය. තවද ඔහුගෙන් වූ ආත්මයකි. එබැවින් අල්ලාහ්ව ද ඔහුගේ රසූල්වරයා ද විශ්වාස කරනු. ත්‍රිත්වය යැයි නොපවසනු (එයින්) වැළකෙනු. (එය) නුඹලාට යහපත් වනු ඇත. සැබැවින්ම අල්ලාහ් ඒකීය දෙවියාමය. ඔහුට දරුවකු සිටීමෙන් ඔහු පිවිතුරුය. අහස්හි ඇති දෑ ද මිහිතලයේ ඇති දෑ ද ඔහු සතුය. භාරකරු වශයෙන් අල්ලාහ් ප්‍රමාණවත්ය.

අන් නිසා 4:172

අල්ලාහ්ට ගැත්තෙකු වීමෙන් මසීහ් හෝ සමීප මලාඉකාවරුන් හෝ දුරස් නොවන්නේමය. ඔහුට ගැතිකම් කිරීමෙන් කවරෙකු දුරස් වී උඩඟු වන්නේ ද එවිට (දැන ගනු) ඔහු වෙත ඔවුන් සියල්ලම (මතු ලොවෙහි) ඔහු එක් රැස් කරනු ඇත.

අල් මාඉදා 5:17

සැබැවින්ම අල්ලාහ් වනුයේ මර්යම්ගේ පුත් මසීහ්ම යැයි පැවසූ අය ප්‍රතික්ෂේප කළෝය. මර්යම්ගේ පුත් මසීහ් ද ඔහුගේ මව ද මිහිතලයේ සිටින සියල්ලන් ද විනාශ කිරීමට අල්ලාහ් සිතුවේ නම් ඔහුගෙන් කිසිවකින් (ආරක්ෂා කිරීමට) ආධිපත්‍යය දරනුයේ කවරෙකු ද? අහස්හි හා මිහිතලයේ ද ඒ දෙක අතර ඇති දැහි ද ආධිපත්‍යය අල්ලාහ් සතුය. ඔහු සිතන දෑ මවන්නේය. තවද සියලු දෑ කෙරෙහි අල්ලාහ් ශක්තිවන්තය.

අල් මාඉදා 5:19

අහෝ දේව ග්‍රන්ථ ලත් ජනයිනි ! (ඊසාට පසු) ධර්ම දූතයින් නොපැමිණි කාලයේ අප වෙත ශුභාරංචි පවසන්නෙකු හෝ

අවවාද කරන්නෙකු හෝ නොපැමිණියේ යැයි නුඹලා නොපවසනු වස් (දැන්) නුඹලාට පැහැදිලි කර දෙන අපගේ රසූල්වරයා නුඹලා වෙත පැමිණ ඇත. දැන් ශුභාරංචි පවසන්නෙකු හා අවවාද කරන්නෙකු නුඹලා වෙත පැමිණ ඇත. තවද අල්ලාහ් සියලු දෑ කෙරෙහි ශක්තිවන්තය.

අල් මාඉදා 5:46

තමන් අතර තිබූ තව්රාතය සත්‍ය කරවන්නෙකු ලෙස මර්යම්ගේ පුත් ඊසා ව ඔවුන්(කලින් සිටි නබිවරුන්)ගේ පියවරෙහි අපි අනුපිළිවෙලින් එව්වෙමු. තවද ඔහුට ඉන්ජීලය ද පිරිනැමුවෙමු. එහි යහමඟක් හා ආලෝකයක් විය. තවද තමන් අතර තිබූ තව්රාතය සත්‍යකරවන්නක් ද විය. තවද (එය) බිය බැතිමතුන් හට මඟ පෙන්වීමක් හා උපදෙසක් ද විය.

අල් මාඉදා 5:72

නියත වශයෙන්ම අල්ලාහ් වනුයේ මර්යම්ගේ පුත් මසීහ් යැයි පැවසූ අය ප්‍රතික්ෂේපකයින් බවට පත් වූහ. ඉස්රාඊල් දරුවනි, මාගේ පරමාධිපති ද නුඹලාගේ පරමාධිපති ද වන අල්ලාහ්ට නුඹලා ගැතිකම් කරනු යැයි මසීහ් පැවසුවේය. සැබෑ කරුණ නම් කවරෙකු අල්ලාහ්ට ආදේශ තබන්නේ ද එවිට අල්ලාහ් ඔහුට ස්වර්ගය තහනම් කළේය. තවද ඔහු ලැඟුම් ගන්නා ස්ථානය නිරය වේ. අපරාධකරුවන්ට උදව් කරන්නන් කිසිවකු නොමැත.

අල් මාඉදා 5:78

ඉස්රාඊල්ගේ දරුවන් අතුරින් ප්‍රතික්ෂේප කළවුන් දාවූද් හා මර්යම්ගේ පුත් ඊසාගේ දිවෙන් ශාප කරනු ලැබීය. එය ඔවුන් පිටුපෑ හේතුවෙන් හා සීමාව ඉක්මවා කටයුතු කරමින් සිටි හේතුවෙනි

අල් මාඉදා 5:110

එවිට අල්ලාහ් මෙසේ පවසයි. අහෝ ! මර්යම්ගේ පුත් ඊසා, ඔබ වෙත හා ඔබගේ මව වෙත වූ මාගේ ආශීර්වාදය ගැන සිහිපත් කරනු. පාරිශුද්ධ ආත්මය තුළින් මම නුඹට උපකාර කළ අවස්ථාවද සිහිපත් කරනු. තොටිල්ලෙහි ද තරුණ වියෙහි ද ජනයා සමඟ නුඹ කතා කළෙහිය. තවද මම නුඹට ධර්මය ද ප්‍රඥාව ද තව්රාතය ද ඉන්ජීලය ද ඉගැන් වූ අවස්ථාව ද සිහිපත් කරනු. මාගේ අනුහසින් පක්ෂියකුගේ හැඩයකින් යමක් මැටියෙන් තනා ඒ තුළ නුඹ පිඹූ විට මාගේ අනුහසින් එය පක්ෂියකු බවට පත් වූ අවස්ථාවද සිහිපත් කරනු. තවද මාගේ අනුමැතියෙන් සුදු හා කළු කුෂ්ට රෝග නුඹ සුව කළෙහිය. මාගේ අනුහසින් මියගියවුන් නුඹ බැහැර කළ අවස්ථාව ද සිහිපත් කරනු. (එසේ) පැහැදිලි සාධක ඉස්රාඊල් දරුවන්ට නුඹ ගෙනැවිත් ඔවුන් අතුරින් ප්‍රතික්ෂේප කළවුන් මෙය පැහැදිලි භූනියමක් මිස නැතැයි පැවසූ විට මා ඔවුන් ව මැඩලූ අවස්ථාව ද සිහිපත් කරනු.

අල් මාඉදා 5:112

අහෝ ! මර්යම්ගේ පුත් ඊසා, අහසින් ආහාර බන්දේසියක් අප වෙත පහළ කිරීමට නුඹගේ පරමාධිපතිට හැකියාව ඇත්තේදැ යි අනුගාමිකයින් විමසා සිටි විට නුඹලා විශ්වාසවන්තයින්ව සිටියෙහු නම් නුඹලා අල්ලාහ්ට බිය බැතිමත් වනු යැයි ඔහු පවසා සිටි අවස්ථාව සිහිපත් කරනු.

අල් මාඉදා 5:114

මර්යම්ගේ පුත් ඊසා, අහෝ ! අපගේ පරමාධිපතියාණනි, අප වෙත අහසින් ආහාර බන්දේසියක් පහළ කරනු මැනව ! එය අපටත් අපට පෙර වූ අයටත් අපගෙන් පසුව පැමිණෙන්නන්ටත් සැමරුමක් වනු ඇත. තවද එය ඔබගෙන් වූ සාක්ෂියක් ද වනු ඇත. තවද අපව පෝෂණය කරනු මැනව ! පෝෂණය කරන්නන්ගෙන් වඩාත් ශ්‍රේෂ්ඨ වනුයේ ඔබය යැයි පැවසුවේය.

අල් මාඉදා 5:116

අහෝ ! මර්යම්ගේ පුත් ඊසා, අල්ලාහ් හැර මා හා මාගේ මව දෙවියන් දෙදෙනකු ලෙස ගන්නැ යි නුඹ ජනයාට පැවසුවේදැ යි අල්ලාහ් පවසන විට ඔහු ඔබ අතිපිවිතුරුය. මට උරුම නොමැති දෙයක් මා පැවසීමට මට (කිසිදු අයිතියක්) නොමැත. එය මම පවසන්නෙකු ව සිටියේ නම් ඔබ එය දැන සිටින්නෙහිය. මාගේ සිත තුළ ඇති දෑ ඔබ දන්නෙහිය. ඔබේ සිත තුළ ඇති දෑ මම නොදනිමි. සැබැවින්ම ඔබ ගුප්ත දෑ පිළිබඳ සර්වඥය යැයි පැවසුවේය

අල් අන්ආම් 6:85

තවද සකරිය්යා, යහ්යා, ඊසා හා ඉල්යාස්ට ද (මඟ පෙන්වූයෙමු.) සියල්ලෝම සදැහැමියන් අතුරිනි.

අත්තව්බා 9:30

උසෙයිර් අල්ලාහ්ගේ පුත්‍රයාණන් බව යුදෙව්වෝ පැවසූහ. එමෙන්ම මසීහ් අල්ලාහ්ගේ පුත්‍රයාණන් බව කිතුණුවෝ පැවසූහ. එය ඔවුන්ගේ මුවවල්වලින් පවසන ඔවුන්ගේ ප්‍රකාශයයි. මීට පෙර ප්‍රතික්ෂේප කළවුන්ගේ ප්‍රකාශයට ඔවුහු සමාන වූහ. අල්ලාහ් ඔවුන්ව විනාශ කරයි. ඔවුන් වෙනතකට යොමු කරනු ලබනුයේ කෙසේ ද?

අල් කහ්ෆ් 18:4

අල්ලාහ් දරුවකු ගෙන ඇතැයි ප්‍රකාශ කළවුනට ඔහු අවවාද කරනු පිණිස ද

අල් කහ්ෆ් 18:5

ඔවුනට හෝ ඔවුන්ගේ මුතුන් මිත්තන්හට ඒ පිළිබඳව කිසිදු දැනුමක් නොමැත. ඔවුන්ගේ මුඛවල්වලින් පිටවන ප්‍රකාශය දරුණු විය. ඔවුහු බොරුව මිස (වෙනකක්) නොපවසති.

අල් මර්යම් 19:16

මෙම දේව ග්‍රන්ථයේ සඳහන් මර්යම් ගැන නුඹ සිහිපත් කරනු.
ඇය තම පවුලෙන් වෙන්ව නැගෙනහිර
ස්ථානයකට ගිය අවස්ථාවේ.

අල් මර්යම් 19:17

එවිට ඇය ඔවුන්ගෙන් වෙන්ව තිරයක් ගත්තාය. එවිට අපි ඇය වෙත අපගේ ප්‍රාණය (හෙවත් ජිබ්‍රීල් මලක්වරයා) එව්වෙමු. එවිට ඔහු සෘජු (සජීවී) මිනිසෙකු වෙසින් ඇය වෙත පෙනී සිටියේය.

අල් මර්යම් 19:18

නියත වශයෙන් නුඹගෙන් ආරක්ෂාව මහා කාරුණිකයාණන්ගෙන් මම පතමි. නුඹ බියබැතිමත් කෙනෙකු වී නම් (මා වෙත ළං නොවනු) යැයි ඇය පැවසුවාය.

අල් මර්යම් 19:19

නියත වශයෙන්ම මම නුඹට පිවිතුරු දරුවකු පිරිනමනු පිණිස නුඹගේ පරමාධිපතිගේ දූතයකු වෙමි යැයි ඔහු පැවසුවේය.

අල් මර්යම් 19:20

කිසිදු මිනිසකු මා ස්පර්ශ කර නොතිබිය දී මට දරුවකු වනුයේ කෙසේ ද? තවද මම අපචාරී (කාන්තාවක්) නොවූයෙමි යැයි ඇය පැවසුවාය.

අල් මර්යම් 19:21

එය එලෙසය යැයි ඔහු පැවසුවේය. එය මා වෙත පහසු කාර්යයකි. එය ජනයාට අපගෙන් වූ සංඥාවක් හා ආශීර්වාදයක් බවට පත් කරනු පිණිසය. එය තීන්දු කරනු ලැබූ නියෝගයක් විය යැයි නුඹගේ පරමාධිපති පැවසුවේය.

අල් මර්යම් 19:22

එවිට ඇය ඔහු ගැබ් ගත්තාය. ඔහු සමඟ ඇය දූර ස්ථානයකට වෙන්ව ගියාය.

අල් මර්යම් 19:23

විළිරුදාව ඇයව ඉඳි කඳක් වෙත ගෙන ආවේය. අහෝ මීට පෙර මා මිය යා යුතු නොවේ ද තවද අමතකවීමෙන් අමතක වූ කෙනකු බවට පත් විය යුතු නොවේදැයි පැවසුවාය.

අල් මර්යම් 19:24

ඇයට පහළ සිට ඇයව අමතා නුඹ දුක් නොවනු සැබැවින්ම නුඹගේ පරමාධිපති නුඹට පහළින් උල්පතක් ඇති කළේයී යැයි පැවසීය.

අල් මර්යම් 19:25

ඉඳි ගසේ කඳ නුඹ දෙසට සොලවනු. නුඹ වෙත නෙලන ලද පැහුණු ගෙඩි වශයෙන් වැටෙනු ඇත.

අල් මර්යම් 19:26

එවිට නුඹ අනුභව කරනු. තවද පානය කරනු. ඇස් පිනවා ගනු. තවද නුඹ මිනිසුන් අතුරින් කිසිවකු හෝ දුටුවෙහි නම් එවිට සැබැවින්ම (කතාවෙන් වැළකී සිටින) උපවාසයක් මම මහා කරුණාවන්තයාණන් හට භාර වූයෙමි. එහෙයින් අද දින කිසිදු මිනිසෙකු සමඟ සැබැවින්ම මම කතා නොකරන්නෙමි.

අල් මර්යම් 19:27

ඔහුව උසුලා ගෙන ඔහු සමගම ඇයගේ සමූහයා වෙත ඇය පැමිණියාය. අහෝ මර්යම් බරපතල කරුණක් සැබැවින්ම නුඹ ගෙනැවිත් ඇතැයි ඔවුහු පැවසුවෝය.

අල් මර්යම් 19:28

අහෝ හාරූන්ගේ සහෝදරිය ! නුඹේ පියා නරක පුද්ගලයකු නොවීය. එමෙන්ම නුඹේ මව ද දුරාචාරී (කාන්තාවක්) නොවීය.

අල් මර්යම් 19:29

එවිට ඇය ඔහු වෙතට (ඔවුන් කතා කිරීම සඳහා) සංඥා කළේය. "බිළිඳු වියේ තොටිල්ලෙහි පසුවන අය සමඟ අපි කෙසේ කතා කරන්නෙම්දැයි ඔවුහු පැවසුවෝය.

අල් මර්යම් 19:30

නියත වශයෙන්ම මම අල්ලාහ්ගේ ගැත්තෙකු වෙමි ඔහු මා වෙත දේව ග්‍රන්ථය පිරිනමා ඇත. තවද මා නබිවරයකු බවට පත් කළේය යැයි ඔහු පැවසුවේය.

අල් මර්යම් 19:31

මා කොතැනක සිටිය ද ඔහු මට සමෘද්ධිය ඇති කළේය. තවද මා ජීවමානව සිටින කල්තාක් සලාතය හා සකාතය (ඉටු කිරීම) පිළිබඳව මට උපදෙස් දුන්නේය.

අල් මර්යම් 19:32

තවද මාගේ මවට ඇප උපස්ථාන කිරීමට ද (උපදෙස් දුන්නේය.) තවද ඔහු මා අභාග්‍යවන්ත ප්‍රබලයෙකු ලෙස මා පත් නොකළේය.

අල් මර්යම් 19:33

තවද මම උපත ලැබූ දිනයෙහි ද මම මරණයට පත් වන දිනයෙහි ද නැවත මා නැගිටුවනු ලබන දිනයෙහි ද මා වෙත සාමය වේවා!.

අල් මර්යම් 19:34

එය මර්යම්ගේ පුත් ඊසා(ගේ ප්‍රකාශය) වේ. සත්‍යය ප්‍රකාශය වන එහි ඔවුහු සැක කරති.

අල් මර්යම් 19:35

දරුවකු ගැනීමට අල්ලාහ්ට (සුදුසු) නොවීය. ඔහු සුවිශුද්ධය. ඔහු යම් කරුණක් තීන්දු කළ විට එයට ඔහු කුන් (වනු) යැයි පවසනවා පමණය එය සිදුවනු ඇත.

අල් මර්යම් 19:36

තවද නියත වශයෙන්ම අල්ලාහ් මාගේ පරමාධිපතිය. නුඹලාගේ ද පරමාධිපතිය. එහෙයින් නුඹලා ඔහුට ගැතිකම් කරනු. මෙය සෘජු මාර්ගයයි.

අල් මර්යම් 19:37

එවිට ඔවුන් අතර වූ කණ්ඩායම් මත ගැටුම් ඇති කර ගත්තෝය. අතිමහත් දින දැකීමෙන් ප්‍රතික්ෂේප කළවුනට විනාශය වේවා!

අල් මර්යම් 19:38

ඔවුන් අප වෙත පැමිණෙන දින ඔවුන්ගේ ශ්‍රවණය කෙතරම් පුදුම සහගතද! තවද (ඔවුන්ගේ) බැල්ම කෙතරම් පුදුම සහගතද! නමුත් අපරාධකරුවෝ පැහැදිලි මුළාවෙහි වෙති.

අල් මර්යම් 19:39

ඔවුහු විශ්වාස නොකරමින් සිටිය දී තවද ඔවුන් නොසැලකිල්ලෙහි සිටිය දී එම අණ තීන්දු කරනු ලබන විට පසුතැවිල්ලට පත් වන දිනය ගැන ඔවුනට නුඹ අවවාද කරනු.

අල් මර්යම් 19:40

නියත වශයෙන්ම අපි මහපොළොව හා ඒ මත ඇත්තවුන් උරුම කර ගන්නෙමු. තවද ඔවුන් නැවත යොමු කරනු ලබනුයේ අප වෙතමය.

අල් මුඃමිනූන් 23:50

තවද මර්යම්ගේ පුත් හා ඔහුගේ මව සංඥාවක් බවට අපි පත් කළෙමු. උල්පත් හා තැනිතලා සහිත උස් තලාවක ඔවුන් දෙදෙනාට අපි නවාතැන් දුනිමු.

අහ්සාබ් 33:7

නබිවරුන් අතුරින් ඔබගෙන් ද නූහ්, ඉබ්‍රාහීම්, මූසා හා මර්යම්ගේ පුත් ඊසාගෙන් ද ඔවුන්ගේ ප්‍රතිඥාව ගත් අවස්ථාව සිහිපත් කරනු. තවද ඔවුන් අතුරින් දැඩි ප්‍රතිඥාවක් අපි ගත්තෙමු

අෂ්ෂූරා 42:13

කවර දෙයක් පිළිබඳව ඔහු නූහ්ට උපදෙස් දුන්නේ ද එය ඔබලාට ඔහු දහම්ගත කළේය. ඔබ වෙත දන්වා සිටි දෑ ද ඉබ්‍රාහීම් වෙත ද මූසා වෙත ද ඊසා වෙත ද අපි කවර දෙයක් උපදෙස් දුන්නේ ද එය ද, ඔබලා දහම සෘජු ලෙස ස්ථාපිත කොට එහි ඔබලා වෙන්ව නොයන ලෙසය. ඔබ කවර දෙයක් වෙත ඔවුන් ඇරයුම් කරන්නේ ද එය ආදේශකයින්ට බැරෑරුම් විය. තමන් අභිමත කරන අය අල්ලාහ් ඔහු වෙත තෝරා ගනී. තවද (පසුතැවිලි වී) හැරෙන අයට ඔහු වෙත ඔහු මඟ පෙන්වයි.

අස්සුහ්රුෆ් 43:59

ඔහු, අපි ඔහුට ආශිර්වාද කළ ගැත්තෙකු මිස නැත. ඉස්රාඊල් දරුවන්ට උදාහරණයක් ලෙස අපි ඔහු පත් කළෙමු.

අස්සුහ්රුෆ් 43:61

තවද නියත වශයෙන්ම ඔහු අවසන් හෝරාවේ සංඥාවයි. එහෙයින් ඒ ගැන ඔබලා සැක නොකරනු. තවද ඔබලා මා අනුගමනය කරනු. මෙය ඍජු මාර්ගයයි.

අස්සුහ්රුෆ් 43:63

ඊසා පැහැදිලි සාධක සමඟ පැමිණි කල්හි, මම ඔබලා වෙත ප්‍රඥාව සමග පැමිණියෙමි. ඔබලා කවර දෙයක් සම්බන්ධයෙන් මතභේද ඇති කරගන්නෙහු ද එහි ඇතැම් දෑ මම ඔබලාට පැහැදිලි කරනු පිණිස. එහෙයින් ඔබලා අල්ලාහ්ට බිය බැතිමත් වනු. තවද ඔබලා මට අවනත වනු. යැයි ඔහු පැවසීය.

අල්හදීද් 57:27

පසුව අපි ඔවුන්ගේ පිය සටහන් අනුගමනය කරවමින් අපගේ දූතවරු එව්වෙමු. තවද මර්යම්ගේ පුත් ඊසාවද අනුගමනය කරන්නට සැළැස්වූයෙමු. තවද අපි ඔහුට ඉන්ජීලය පිරිනැමුවෙමු. තවද ඔහුව අනුගමනය කළවුන්ගේ හදවත් තුළ ආදරය හා කරුණාව ඇති කළෙමු. ඔවුහු තපස් බව අලුතින් ඇති කර ගත්තෝය. අල්ලාහ්ගේ තෘප්තිය සොයනු පිණිස මිස අපි ඔවුන් වෙත එය නියම නොකළෙමු. එහෙයින් ඔවුන් එය පිළිපැදිය යුතු නියම අයුරින් එය පිළිනොපැද්දෝය. එහෙයින් ඔවුන් අතුරින් විශ්වාස කළවුනට ඔවුන්ගේ කුලිය අපි පිරිනැමුවෙමු. තවද ඔවුන් අතුරින් බහුතරයක් දෙනා පාපතරයෝය.

අස්සාෆ් 61:6

ඉස්රාඊල් දරුවනි, මා ඉදිරියේ ඇති තව්රාතය තහවුරු කරන්නෙකු ලෙසින් ද මගෙන් පසුව පැමිණෙන තම නාමය අහ්මද් නමැති දූතයකු ගැන ශුභාරංචි දන්වන්නකු ලෙසින් ද මම නුඹලා වෙත පැමිණ ඇති අල්ලාහ්ගේ දූතයකු වෙමි යැයි මර්යම්ගේ පුත් ඊසා පැවසූ අවස්ථාව සිහියට නගනු. නමුත් ඔවුන්

වෙත පැහැදිලි සාධක සමග ඔහු පැමිණි කල්හි මෙය පැහැදිලි හූනියමකි යැයි ඔවුහු පැවසූහ.

අස්සාෆ් 61:14

අහෝ විශ්වාස කළවුනි, නුඹලා අල්ලාහ්ගේ උදව්කරුවන් ලෙස සිටිනු. අල්ලාහ් වෙත මට උදව් කරන්නෝ කවුරුන් දැ?යි මර්යම්ගේ පුත් ඊසා ගෝලබාලයින්ට පැවසුවාක් මෙනි. අපි අල්ලාහ්ගේ උදව්කරුවෝ වෙමු යැයි හවාරියවරු පැවසූහ. එවිට ඉස්රාඊල් දරුවන්ගෙන් පිරිසක් විශ්වාස කළ අතර තවත් පිරිසක් ප්‍රතික්ෂේප කළේය. එවිට අපි විශ්වාස කළවුන්ව ඔවුන්ගේ සතුරන්ට එරෙහිව අපි ශක්තිමත් කළෙමු. එවිට ඔවුහු උර දෙන්නන් බවට පත් වූහ.

අත්තහ්රීම් 66:12

තවද තම ලිංගාශ්‍රය සුරක්ෂා කර ගත් ඉම්රාන්ගේ දියණිය වූ මර්යම් (ගේ උපමාව ද ගෙන හැර දක්වීය) අපගේ ආත්මයෙන් ඒ වෙත අපි පිඹුවෙමු. තවද ඇයගේ පරමාධිපතිගේ වදන් හා ඔහුගේ ග්‍රන්ථ ඇය තහවුරු කළාය. තවද ඇය යටහත් වන්නන් අතුරින් වූවාය

අවසානය වශයෙන් .....

අදරණීය සහෝදර සහෝදරියනි

මෙම කෘතිය වාර ගණනාවක් කියවූ ඔබට සත්‍යතාවය පිළිබඳ අවබෝධයක් ලැබී ඇතයි සිතමු. වටහා ගත් ඔබ කල යුත්තේ මෙම සත්‍යය පිළිගැනීමයි. ඊසා (අලෙ) තුමාණන්ව සහ ඔහුගේ මව මරියම් (අලෙ) තුමියව දෙවියෙක් ලෙසට නැමදුම් කිරීම අතහැර ඒකීය වූ දෙවියා වන අල්ලාහ්ව පිළිගෙන විශ්වාස කර ඊසා (අලෙ) තුමාණන්ට පසුව පැමිණි අවසාන දේවදූතයා වන මුහම්මද් (සල්) තුමාණන්ව විශ්වාස කර මෙලොව ජීවිත හා මරණින් මතු පරලොව ජීවිතය සාර්ථක කර ගැනීමට ඔබ සියලු දෙනාව ඉතා සාදරයෙන් ආදරයෙන් පිළිගනිමු.

අමතර විස්තර ලබා ගැනීමට ශුද්ධ වූ අල්කුර්ආනය මුළුමනින්ම ඉගෙන ගැන අවබෝධයක් ලබා ගැනීමට සහ අවසාන දේව ග්‍රන්ථයේ සඳහන් වී ඇති නීති රීති දැනගැන ක්‍රියා කිරීමට කෘතියේ පිට කවරේ ඇති QR Code භාවිතා කරන්න.

මෙහි අල්කුර්ආනය ඉංග්‍රීසි, මැලේ, හින්දි, කන්නඩ, තෙළිඟානා සහ දමිළ භාෂාවෙන් ඉගැනගත හැකිය. ඔබ ප්‍රිය කරන භාෂාවෙන් බාගත කර ගත හැකිය. එසේම අල්කුර්ආනයේ මුද්‍රණයක් අවශ්‍ය වූ බැවින් මෙහි සඳහන්ව ඇති දුරකථන අංකයට ඇමතුමක් ලබාදෙන මෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටින්නෙමු.

මිනිසුන් හට යහමාර්ගය ලබාදෙනු මැනව!

සත්‍යතාවය එසේම වටහාගැනීමට වරප්‍රසාද ලබාදෙනු මැනව!

අපගේ මෙම කාර්යභාරය පිළිගනු මැනව!

සත්‍යතාවය වෙත පැමිණෙන්න


ජනයා එකම සමූහයක් වූහ. පසුව අල්ලාහ් ශුභාරංචි පවසන්නන් ලෙස ද අවවාද කරන්නන් ලෙස ද නබිවරුන්ව එවීය. තවද කවර දෙයක් මත මතභේද ඇති කර ගත්තේ ද ඒ ගැන ජනයා අතර තීන්දු කිරීම පිණිස ඔවුන් සමඟ දේව ග්‍රන්ථ ද පහළ කළේය. තමන් වෙත පැහැදිලි සාධක පැමිණි පසුව ඔවුන් අතර තිබූ ඊර්ෂ්‍යාව හේතුවෙන් දේව ග්‍රන්ථය ලත් ජනයා මිස (වෙන කිසිවෙක්) ඒ ගැන මතභේද ඇති කර නොගත්තේය. පසුව සත්‍යයෙන් යුත් කවර දෙයක් තුළ ඔවුන් මත භේද ඇති කර ගත්තේ ද ඒ ගැන අල්ලාහ් තම අනුබලයෙන් විශ්වාස කළවුනට මඟ පෙන්වීය. තවද අල්ලාහ් තමන් අභිමත කරන අයට ඍජු මඟ පෙන්වන්නේය. (2:213)

අල්ලාහ්ගෙන් වූ ආලෝකයක් ද පැහැදිලි දේව ග්‍රන්ථයක් ද නුඹලා වෙත පැමිණි ඇත

අහෝ දේව ග්‍රන්ථ හිමියනි ! දේව ග්‍රන්ථයෙන් නුඹලා සඟවමින් සිටි දැයින් බොහෝමයක් නුඹලාට ඔහු පැහැදිලි කරන අපගේ රසූල්වරයා සැබැවින්ම නුඹලා වෙත පැමිණ ඇත. ඔහු බොහෝ දේවල් නොසලකා හරිනු ඇත. සැබැවින්ම අල්ලාහ්ගෙන් වූ ආලෝකයක් ද පැහැදිලි දේව ග්‍රන්ථයක් ද
නුඹලා වෙත පැමිණි ඇත. (5:15)

ඍජු මාර්ගය හා රහ්මතයක් (දායාදයක්) වීම

කවර දෙයක ඔවුන් මත ගැටුම් ඇති කර ගත්තේ ද එය ඔවුනට නුඹ පැහැදිලි කරනු පිණිස ද විශ්වාස කරන ජනයාට මඟ පෙන්වීමක් හා ආශීර්වාදයක් වනු පිණිස ද මිස අපි නුඹ වෙත දේව ග්‍රන්ථය පහළ නොකළෙමු. (16:64)








Who is Prophet Muhammed ?


Say, "I am not something new among the messengers, nor do I know what will be done with me or with you. I only follow that which is revealed to me, and I am no but a clear warner.

Quran 46:9








Quran
6 LANGUAGES
Scan here to read it



One God?
or
Many gods?
Scan here to read it


एक भगवान?
या
अनेक भगवान?
पढ़ने के लिए स्कैन करें


Prophet Muhammad
The Last Messenger
Scan here to read it


What happens after Death?
2 stages of Life
(Life in buried place & Life after resurrection)
Hell? or Heaven?
Scan here to read it


Are you also a seeker
of True God?
Scan here to read it


Truths told in Quran about
Jesus and Mary
(peace be upon them).
Scan here to read it


Does God exist?
Will He show up?
Scan here to read it


Its for you!
Fellow Muslims!!
Scan here to read it